““# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2455/02 – 2025 සැප්තැම්බර් මස 22 වැනි සඳුදා – 2025.09.22**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2018/183.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.10.23 දිනැති හා අංක 2355/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.10.18 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මිනුවන්ගොඩ, මාතම්මන, ගම්මැද පාර, අංක 64/5 ඒ ලිපිනයෙහි පදිංචි ඩබ්. ඒ. ඒ. චමින්ද මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 01, චෛත්‍ය පාර, අංක 19 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/61/2023 හා 2025.07.22 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 045422 – 18 (2025/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව

IR/COM/03/2018/183
නඩු අංකය : A/61/2023

ඩබ්ලිව්. ඒ. ඒ. චමින්ද මයා,
අංක 64/5 ඒ, ගම්මැද පාර,
මාතම්මන,
මිනුවන්ගොඩ.

*පළමු පාර්ශ්වය*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 19,
චෛත්‍ය පාර,
කොළඹ 01.

*දෙවන පාර්ශ්වය*

වර්ෂ 2025 ක් වූ ජුලි මස 22 වන දින දීය.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත කී ආරාවුල් පනතේ 4(1) වගන්තියට අනුව අමාත්‍යවරයා විසින් බේරුම්කරණ අධිකරණය වෙත මෙම ආරාවුල විසඳීම සඳහා යොමු කිරීම නීත්‍යානුකූල තීරණයක් බවට තීරණය කරමින් දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කරමි.

ආරාවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ.

“ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2000.02.18 දින සිට සේවයේ යොදවන ලද ඩබ්. ඒ. ඒ. චමින්ද මයා 2016.10.17 දින සිට සේවයෙන් පහ කිරීම සාධාරණ හා යුක්ති සහගත වන්නේද? එසේ නොවේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

මෙම බේරුම්කරණ ආරාවුල විසඳීම සඳහා මා වෙත ඉදිරිපත් කිරීමට ප්‍රථම පූර්වගාමී බේරුම්කරුවන් දෙදෙනෙකු ඉදිරියේ එනම් A/25/2020 සහ A/25/2021 අංක යටතේ විභාග කිරීමට නියමිතව තිබූ නමුත් එම බේරුම්කරුවන් විවිධ හේතුන් මත ඉවත් වීම හේතුවෙන් මෙකී ආරාවුල අංක A/61/2023 යටතේ මා වෙත ඉදිරිපත් කරන ලදී.

මෙම බේරුම්කරණ ක්‍රියාවලිය 2023.01.21 වන දින ඉල්ලුම්කරු වෙනුවෙන් එච්. ඒ. ජී. මයිකල් මහතාද දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීති නිළධාරි එම්. එම්. රිස්වාන් මහතා සමග කනිෂ්ඨ නීති නිළධාරි ලුෂාන්ති ද සිල්වා මහත්මිය පෙනී සිටිමින් මා ඉදිරියේ කැඳවූ අවස්ථාවේ දෙපාර්ශ්වය විසින් ප්‍රකාශ කරනු ලැබුවේ අංක ඒ/25/2021 යටතේ පූර්වගාමී බේරුම්කරු ඉදිරියේදී පළමු ප්‍රකාශ, ප්‍රති උත්තර දෙපාර්ශ්වය විසින් ගොනුකර ඇති බවත්, පළමු පාර්ශ්වයේ මූලික සාක්ෂි දිවුරුම් ප්‍රකාශයක් මඟින් සහ A-1 සිට A-5 දක්වා ලේඛන සමග ගොනුකරන බව ප්‍රකාශ කර ඇත. පසුව මෙම ආරාවුල බේරුම්කරණ අධිකරණයේ පූර්වගාමී බේරුම්කරු ඉදිරියේ කැඳ වූ අවස්ථාවේ පළවන පාර්ශ්වය විසින් ගොනුකරනු ලැබූ දිවුරුම් පෙත්සම සහ A-1 සිට A-5 දක්වා ලේඛණ වලට අමතරව A-6 සහ A -7 ලෙස ලේඛන දෙකක් ඉදිරිපත් කරමින් සහ ඒවා බේරුම්කරණය ඉදිරියේ ලකුණු කරමින් 2022.12.22 වන දින සඳහන් දිවුරුම් ප්‍රකාශයේ ඉල්ලා ඇති සහන ලබාදෙන ලෙස ඉල්ලා ඇත.

මෙම දිවුරුම් ප්‍රකාශය වෙනුවෙන් දෙවන පාර්ශ්වයට හරස් දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමටත්, අවශ්‍ය නම් දෙවන පාර්ශ්වයට පළමු පාර්ශ්වයෙන් හරස් ප්‍රශ්න ඇසීමට පූර්වගාමී බේරුම්කරු නියම කර ඇත.

2023.11.21 වන දින මා ඉදිරියේ කැඳවූ අවස්ථාවේ ඉල්ලුම්කරු වෙනුවෙන් එච්. ඒ. ජී. මයිකල් මහතාද දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීති නිළධාරී එම්.එම්. රිස්වාන් මහතා සමග කනිෂ්ඨ නීති නිළධාරී ලූෂාන්ති ද සිල්වා මහත්මිය පෙනී සිටිය අතර එදින ඉල්ලුම්කරු පෙනී නොසිටි අතර ඔහු විදේශගත වී ඇති බවට පළමු පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටින නියෝජිත මහතා දන්වා සිටින ලදී. ඔහුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට 2024.02.26, 2024.02.27 වන දිනයන් පළමු පාර්ශ්වයේ ඉල්ලීම මත නියම කරන ලද අතර එදින පළමු පාර්ශ්වය නොමැති වුවහොත් නිෂ්ප්‍රභා කරන බවත් දන්වා සිටින ලදී. 2023.12.20 වන දින දෙවන පාර්ශ්වය පළමු ප්‍රකාශය ඉදිරිපත් කර ඇති අතර එයට පිළිතුරු ලබාදීමට අවශ්‍ය වේ නම් 2024.01.22 වන දිනට ප්‍රථම දෙවන පාර්ශ්වය විසින් පිලිතුරු ලබාදීමටත් දන්වා සිටින ලදී.

2024.02.26 වන දින කැඳ වූ අවස්ථාවේදී ඉල්ලුම්කරු පැමිණ සිටින ලද අතර, ඔහුගෙන් දෙවන පාර්ශ්වය හරස් ප්‍රශ්න විමසීම ආරම්භ කරන ලදී.

පළමු පාර්ශ්වය විසින් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය මඟින් ඉල්ලුම්කරු කිසි විටකත් ඔහුට රැකියාව ලබා ගැනීමට ආයාචනය කර නැති අතර රැකියාව අහිමි කිරීම සම්බන්ධයෙන් සහ එයට අනුශාංගිකව පැන නැගී ඇති කරුණු සම්බන්ධයෙන් වන්දි ලබාදෙන ලෙස දක්වා ඇත.

නමුත් පසුව ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න සහ නැවත ප්‍රශ්න විමසීමේදි ඔහුගේ ඉහත කී ස්ථාවරය වෙනස්කර නැවත රැකියාව ලබාගැනීමේ අපේක්ෂාවෙන් සාක්ෂි ලබා දී ඇත.

මෙහිදී ඉල්ලුම්කරු වෙනුවෙන් ඉල්ලුම්කරුගේ සාක්ෂිය මෙහෙය වීමෙන් අනතුරුව පළමු පාර්ශ්වය විසින්, දෙවන පාර්ශ්වයේ එනම් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවය කරනු ලබන මෙම සිද්ධිය සම්බන්ධයෙන් විනය පරීක්ෂණය පැවැත්වූ කුමාරි සිරිවර්ධන යන අයද, ගිණුම් විස්තර ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයකු හැටියට පී.පී.එස්. වික්‍රමරත්න යන අයද සාක්ෂි ලබාදීම සඳහා කැඳවන ලදී. මෙහිදී කුමාරි සිරිවර්ධන යන අයගේ සාක්ෂි ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් මෙහෙයවන අවස්ථාවේදී ඇයගෙන් පළවන පාර්ශ්වය වෙනුවෙන් A8 සිට A12 දක්වා ලේඛන ලකුණු කරන ලදී. ඉහත කී සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මෙහෙයවීමෙන් අනතුරුව පළවන පාර්ශ්වය ඔවුන්ගේ නඩුව අවසන් කරන ලද අතර, ඉන්පසුව දෙවන පාර්ශ්වය වෙනුවෙන් අභ්‍යන්තර විගණන කොට්ඨාසයේ සේවය කරන ඒ. එස්. එම්. ඒ. සලාම් සහ අභ්‍යන්තර විගණන කොට්ඨාසයේ කළමනාකරු (පරිපාලන) ඒ. එල්. එම්. සුම්රි යන අයද සාක්ෂි සඳහා කැඳවා ඔවුන්ගේ සාක්ෂි මෙහෙයවා අවසන් කරන ලදී. ඉන්පසු දෙපාර්ශ්වයටම ලිඛිත දේශන නියම කිරීම සඳහා දිනයක් ලබාදෙන ලදී.

මෙම බේරුම්කරණයේදී මා ඉදිරියේ දෙපාර්ශ්වය විසින් මෙහෙය වූ සාක්ෂි අනුව විසඳිය යුතුව ඇත්තේ

2016.10.17 වන දින අභ්‍යන්තර විගණන පරීක්ෂණ කණ්ඩායමක් මෙම ඉල්ලුම්කරු සේවය කරන ස්ථානයට පරීක්ෂා කිරීම සඳහා පැමිණියේද?

එසේ පැමිණියේ නම් එම අවස්ථාවේ ඉල්ලුම්කරු සේවා ස්ථානයේ හෝ ඊට අදාළ රාජකාරියන් කරමින් සිටියේද?

එසේ සේවයේ නොසිටියේ නම් ඔහුට විරුද්ධව පැවැත්වූ නිදහසට කරුණු විමසීම සහ විනය පරීක්ෂණය නිසි අයුරින් ඉටුකර ඇත්ද?

එකී සියළු කරුණු වලට පිළිතුර ඔව් නම් ඉල්ලුම්කරු සේවයෙන් පහකිරීම සාධාරණ හා යුක්ති සහගත වන්නේද? යන්න වේ.

ඉල්ලුම්කරුගේ සාක්ෂියේදී ඔහු ප්‍රකාශ කර සිටින්නේ

“ මෙම ප්‍රශ්න ගත සිද්ධිය සිදුවුණු කාලයේ ඔහුව ආහාර කාමරයේ සේවය කිරීමට යොදවා ඇති බවත්, 2016.10.17 වන දින වැඩට වාර්තා කොට රාත්‍රී 7.30 ට පමණ ආහාර බෙදීමේ කාර්යය සඳහා යෙදුන බවත්, අධික හිසරදය නිසා ඔහුත් සමග වැඩ කල කුමාරටයි, අරෝෂ්ටයි කියලා සමගි පාලමේ කැන්ටිමෙන් පැනඩෝල් පෙත්තක් බොන්න බැස්ස බවත් වර්ෂාව තුරුල් කිරීමෙන් අනතුරුව රාත්‍රී 8.30 ට සේවා ස්ථානයට පැමිණ ඉහළ මාලයේ විවේකාගාරයේ රැඳී සිට 2016.10.18 උදෑසන සේවයේ නිමකර ගිය බව” දක්වා ඇත.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් බේරුම්කරණය ඉදිරියේ හදිසි පරීක්ෂාවකට සහභාගී වූ ඒ. එස්. එම්. ඒ. සලාම් මහතාද ඒ. එල්. එම්. සුමිරි මහතාද සාක්ෂි ඉදිරිපත් කරමින්, ප්‍රකාශ කර සිටියේ 2016.10.17 වන දින සේවක මහතුන් සේවා ස්ථානයේ සිටිනවාදැයි පරික්ෂා කිරීමට කණ්ඩායමක් සහභාගි වූ බවත් මෙම ඉල්ලුම්කරු එදින සේවය කරන ස්ථානයට මෙම සාක්ෂිකරුවන් ගිය බවත් පැය 1/2 ක පමණ කාලයක් එම ස්ථානයේ සිටි බවත්, එම ස්ථානයට සේවක මහතුන් හතර දෙනෙක් සේවයේ යොදවා සිට ඇති අතර ඉන් එක් අයෙක් මෙම ඉල්ලුම්කරු වන අතර ඔහුව ආහාර කාමරයේ සේවයේ යොදවා සිටි නමුත් ඔහු සේවා ස්ථානයේ නොසිටි බවත් ඔවුන් ආහාර කාමරයේ සේවක මහතුන් පරීක්ෂා කිරීමේදී ඉල්ලුම්කරු නොසිටි අතර ඔහු කැන්ටිමට ගිය බව ආහාර ලිපිකරු පැවසූ බවත්ය.

ඉල්ලුම්කරු වෙනුවෙන් මූලික සාක්ෂියේදී A-11 සහ A-11a ලෙසට එම ස්ථානයේ 2016.10.17 වන දින සේවය කළ සේවක මහතුන්ගේ හදිසි සේවක පරීක්ෂාව නැමැති ලේඛනය ලකුණු කරන ලද අතර එකී A-11 සහ A-11a දරන ලේඛන අදාළ කර ගනිමින් එහි සේවය කරන සේවකයන් පරීක්ෂා කරන බවත් එසේ නොමැති සේවකයින් එහි සටහන් කිරීමක් නොකරන බවත්, මෙම සාක්ෂිකරුවන් විසින් එම ස්ථානයේ සුපවයිසර් මහතාගෙන් හා මිල් ක්ලාක්ගේ අත්සන් ගත් බවත්, ප්‍රකාශ කරයි.

මෙහිදි නියමිත රාජකාරී ස්ථානයේ සේවකයකු නොමැති නම් ඒ බව හදිසි පරීක්ෂණ වාර්තාවේ සටහන් කරනු ලබන බවත් එතන සිටින සුපවයිසර්ගෙන් අත්සන් ලබාගන්නා බවත්, එකී වාර්තාව අනුව ඉල්ලුම්කරු වන චමින්ද යන අයගේ සේවා අංකය සටහන් කරනු ලබන බවටත් සාක්ෂි ලබා දී ඇත. එකී ලේඛණය A-11 සහ A-11a ලෙස ඉල්ලුම්කරු වෙනුවෙන් කැඳවූ සාක්ෂිකාරිය වන කුමාරි සිරිවර්ධන යන අය මාර්ගයෙන් බේරුම්කරණ අධිකරණයට ඉදිරිපත් කර ඇත.

මෙහිදි දෙවන පාර්ශ්වය විසින් හදිසි වැටලීමට ගිය ඒ. එස්. එම්. ඒ. සලාම් යන සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමේදී මෙම A- 11a ලේඛනයේ ඔහුගේ අත්සන ඇති බවත්, එය ඔහු විසින් හඳුනාගැනීමෙන් අනතුරුව දෙවන පාර්ශ්වය විසින් ඔහුගේ එකී අත්සන R-20 ලෙසට ලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙසේ ඉල්ලුම්කරු සේවා ස්ථානයේ නොමැති බවට හදිසි වැටලීම් කණ්ඩායම තහවුරු කරගත් පසු ඔහු පැමිණිය හොත් දන්වා සිටින ලෙසට ප්‍රකාශ කර එම ස්ථානයෙන් බැහැරවී ඇත.

මේ සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ සාක්ෂියේදී ඔහු ප්‍රකාශ කර සිටියේ ඒ කිසිවක් නොදන්නා බවත් ඔහු නිදා සිට පාන්දර ආහාර ලිපිකරු නිදා සිටියදී ටෝකන් පත්‍රය රැගෙන සේවය අවසන් කර ගෙදර ගිය බවත් ඔහුගේ අසනීප තත්ත්වය වැඩිවීම හේතු කොටගෙන දින දෙකකට පසු සේවයට වාර්තා කළ බවයි. එසේ වාර්තා කළ අවස්ථාවේ ඔහුට මෙම සිද්ධිය ප්‍රකාශ කර ඇතත් ඔහු ඒ සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොමැත. දෙවන පාර්ශ්වය විසින් මෙම ආහාර කාමරයේ 20.05 සිට 20.25 කාලය තුළ පරික්ෂාව සිදුකල බවට සටහන් කර ඇතත් ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න ඇසීමේදී එම ස්ථානයේ පරීක්ෂණ කණ්ඩායම් විනාඩි 15 ක පමණ කාලයක් සිටි බවට පෙන්නුම් කරමින් එකී පරීක්ෂණය විධිමත් නොමැති බවට ප්‍රකාශ කළ ද එම කරුණු ප්‍රථම වරට ඉදිරිපත් කරනු ලබන්නේ බේරුම්කරණයේදී වන අතර එසේම පරීක්ෂණ කණ්ඩායම එම ස්ථානයේ සිටි කාලය තුළ එම ස්ථානයේ සේවය කළ ඉතිරි තිදෙනාම එම ස්ථානයේදී මුනගැසී ඇති අතර මෙම ඉල්ලුම්කරු පමණක් සේවා ස්ථානයේ හෝ සේවය කරමින් සිටිය බවට තහවුරු වීමත් සිදු වී නොමැති බවත් එම පරීක්ෂණය විධිමත්ව සිදු කර ඇති බවත් පෙනීයන කරුණකි.

මොහු කැන්ටිමේ සිටිනවාදැයි බැලීමට සේවකයෙකු යැවුමුත් ඔහු පැමිණ ප්‍රකාශ කර ඇත්තේ ද ඉල්ලුම්කරු කැන්ටිමේ නොමැති බවයි.

වැටලීමට සහභාගී වූ නිළධාරීන් එම ස්ථානයේ සිටින අවස්ථාවේ එක් සේවකයෙකු ආහාර බෙදන ලොරියෙන් පැමිණ ඇත.

මෙහිදි දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි දෙනු ලැබූ වැටලීමට සහභාගී වූ ඒ. එස්. එම්. ඒ. සලාම් මහතාගෙන් බේරුම්කරු විසින් අසන ලද ප්‍රශ්නවලට ඔහු පහත අයුරින් පිළිතුරු දී ඇත.

ප්‍ර. තමාලා එම ස්ථානයට ගිහිල්ලා සේවකයෝ ඉන්නවාද නැද්ද කියලා බලනවා. ඊටපස්සේ සේවකයෝ ඒ වේලාවේ පේන්න හිටියේ නැත්නම් තමාලා මොකද කරන්නේ?

පි. විනාඩි 10 ක් 15 ක් බලනවා. ආවේ නැත්නම් අපේ ලොකු මහත්තයාගෙන් අහනවා. මේ කෙනා නෑ සර් මොනවද කරන්නේ කියලා. එයා කියනවා විනාඩි 05 ක් හරි බලලා ලියන්න කියලා එතකොට අපි විනාඩි 5 ක් බලලා අපි ලියලා අතන ඉන්න සුපවයිසර් මහත්තයාගෙන් අත්සන් අරන් පහලට ගිහිල්ලා ඊට පස්සේ ලොකු මහත්තයාට භාර දෙනවා.

ප්‍ර. මෙතන නැත්නම් සුපවයිසර් එක්ක කතා කරනවාද ඒ සම්බන්ධයෙන්?

පි. ඔව් කතා කරනවා. අපි කිව්වා ඉක්මනට එන්න කියන්න කියලා එයා කිව්වා අපි දන්නේ නැහැ ඔයාලා ගන්න ක්‍රියාමාර්ගයක් ගන්න කියලා.

ප්‍ර. මෙහෙම මෙම සිද්ධියේදීත් ක්‍රියාමාර්ගය තමන්ලා ගත්තාද?

පි. ඔව්

ප්‍ර. ඊටපස්සේ කොයිම වෙලාවක හරි තමන්ලට එම දිනයේ චමින්ද කියන ඉල්ලුම්කරු ඒ දවස ඇතුලත වාර්තා කලාද?

පි. නැහැ

ප්‍ර. සුපවයිසර් කිව්වෙත් නැහැ චමින්ද ආවා කියලා?

පි. කිව්වේ නැහැ

ප්‍ර. තමාලා දැනුවත් වුනෙත් නැහැ ආවාද කියලා?

පි. නැහැ

ප්‍ර. තමාලා සිටි තැන සිට ඔය හතර දෙනා සේවයේ යොදවලා තිබුණා නේ කොහේ හරි?

පි. ඔව්

ප්‍ර. කොහේහරි සේවයේ යොදවපු කෙනෙක්ට දැනුම් දුන්නා නම් තමාලා ඉන්න තැනට එන්න වෙලාව ඇතිද ඔහුට?

පි. එයාලා වැඩට දාලා තිබෙන්නේ මිල් රූම් එකට එක් කෙනෙක් ඩියුටි ගිහිල්ලා තිබුණා. කෑම ලොරියේ එයා ආවා

ප්‍ර. කෑම ලොරියේ ගිය කෙනා ආවා?

පි. ආවා

ප්‍ර. චමින්දව දාලා තිබ්බේ කොහාට කියලද කිව්වේ?

පි. ඒ ගොල්ලෝ කිව්වේ මිල් රූම් එකට දාලා තිබ්බේ කියලා

ප්‍ර. කෑම බෙදන්න ගියේ එක්කෙනයි.

පි. ඔව්

(2024.10.14 පෙ.ව 10.00 ආරම්භක සටහන් වල 30, 31, 32 පිටු)

වැටලීමේ නිළධාරීන් නිසි පරිදි ලේඛනවල සටහන් තබා පැමිණිලිකරු සේවා ස්ථානයේ නොමැති බවට තහවුරු කර එය අදාළ ප්‍රධානීන්ට දැනුම් දීමෙන් අනතුරුව ඉල්ලුම්කරුට විරුද්ධව 2016.10.17 වන දින සේවයේ යෙදී සිටියදී අනවසරයෙන් සේවා ස්ථානය හැරයාම සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් පැවැත්වීමට ඉල්ලුම්කරුගෙන් නිදහසට කරුණු විමසා ඇති අතර එහිදී ඔහු ඒ

සම්බන්ධයෙන් නිදහසට කරුණු ඉදිරිපත් කර ඇති අතර, එයට 2016.11.28 වන දින පිළිතුරු සපයා ඇති අතර එකී පිළිතුර R-8 ලෙස දෙවන පාර්ශ්වය විසින් බේරුම්කරණ අධිකරණයෙන් ලකුණු කොට ඇත. එකී පිළිතුරෙහි ඔහු විසින් එහිදී ඉල්ලා ඇත්තේ එකී නිදහසට කරුණු ප්‍රමාණවත් නොවේ නම් ඔහුගේ නිර්දෝෂීභාවයට සනාථ කිරීමට විධිමත් විනය පරීක්ෂණයක් ලබා දෙන ලෙසත්ය. එය දෙවන පාර්ශ්වය විසින් $R\text{-}8_1$ ලෙස ඉදිරිපත් කර ඇත.

පළමු පාර්ශ්වය විසින් දෙන ලද නිදහසට කරුණු වලින් සෑහීමකට පත් නොවුන දෙවන පාර්ශ්වය ඉල්ලුම්කරුට එරෙහිව විනය පරීක්ෂණයක් සිදු කිරීමට තීරණය කරන ලදී. එකී විනය පරීක්ෂණයට සහභාගි වන ලෙස යැවූ ලිපිය R-14 ලෙස ලකුණු කොට ඉදිරිපත් කරන ලදී. එම විනය පරීක්ෂණ වාර්තාව පළමු පාර්ශ්වය විසින් A-9 ලෙසින් බේරුම්කරණ අධිකරණයට ඉදිරිපත් කර ඇත.

මෙහිදී ඉල්ලුම්කරු වෙනුවෙන් කැදවනු ලැබූ විනය පරීක්ෂණය සිදුකරන ලද කුමාරි සිරිවර්ධන යන සාක්ෂිකාරියගෙන් දෙවන පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න ඇසීමේදී ඉල්ලුම්කරු විසින් නිදහසට ඉදිරිපත් කරන ලද ලිපිය R-8 ලෙසට ඉදිරිපත් කර ඇති බව පිළිගන්නා අතර එහි තවදුරටත් අවශ්‍ය වුවහොත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙසටත් ඉල්ලීමක් කර ඇති බවටත් ප්‍රකාශ කර ඇති බවට බේරුම්කරණ ඉදිරියේ සාක්ෂි ලබාදෙන ලදී.

දෙවන පාර්ශ්වය විසින් කුමාරි සිරිවර්ධන යන අයගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී ඇය විසින් පහත දක්වා ඇති පරිදි පිළිතුරු ලබා දී ඇත.

ප්‍ර. ඔබ විසින් ලබාදෙන චෝදනා පත්‍රයට ඉල්ලුම්කරු විසින් සපයා ඇති උත්තර R-8 ලෙස ලකුණු කරලා තිබෙනවා?

උ. ඔව්

ප්‍ර. එහි අවශ්‍ය වුනොත් විනය පරීක්ෂණය පවත්වන ලෙස මෙම නඩුවේ ඉල්ලුම්කරු විසින් ඉල්ලීමක් කරලා තිබෙනවා?

උ. ඉල්ලීමක් කරලා තිබෙනවා.

ප්‍ර. R-8 ලෙස ලකුණු කර ඇති මෙම ලේඛනයේ එම ඉල්ලීම වන්නේ?

උ. විධිමත් පරීක්ෂණයක් ලබාදෙන ලෙස (අදාළ ඡේදය කියවයි)

ප්‍ර. ඒ කියන්නේ ඉල්ලුම්කරු විසින්ම මේ සම්බන්ධයෙන් සෑහීමකට පත්වන්නේ නැතිනම් විනය පරීක්ෂණයක් ඉල්ලා සිටිනවා?

උ. ඔව්

එම ඡේදය R-8 (1) ලෙස ලකුණු කර ඇත.

ප්‍ර. එසේ වගඋත්තරයක් ලබා දුන්නාට පසු ඔබතුමිය විසින් විනය පරීක්ෂණයට ඇරැවුම් ලිපියක් මෙම ඉල්ලුම්කරු වෙත යොමුකර තිබෙනවා?

උ. ඔව්

ප්‍ර. එම විනය පරීක්ෂණය සඳහා යොමු කළ ලිපිය ද මේ ?

උ. ඔව්

එම ලිපිය R-14 ලෙස ලකුණු කර ඇත.

(2024.04.26 ආරම්භක සටහන් 10 සහ 11 වෙනි පිටුව)

මෙම විනය පරීක්ෂණයට ඉල්ලුම්කරු වෙනුවෙන් සහයක මිත්‍රයා ලෙසට වෘත්තිය සමිති නියෝජිතයකු ප්‍රේමරත්න ගුරුසිංහ මහතා පෙනී සිටින ලදී.

එසේම එම විනය පරීක්ෂණය සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවයක් නොමැති බව ද ඉල්ලුම්කාර පාර්ශ්වයෙන් ප්‍රකාශ කර ඇත.

විනය පරීක්ෂණයේදී ඉල්ලුම්කරු විසින් සාක්ෂි දී ඇතත් ඔහුට එරෙහිව ඉදිරිපත් කරන ලද චෝදනා සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් දෙනු ලැබූ සාක්ෂිය තහවුරු කිරීමට හැකි හොඳම සාක්ෂිකරුවන් මොහු සමග එදින සේවය කළ කිසිදු සේවකයකු ඔහු වෙනුවෙන් සාක්ෂි දීමට කැඳවා නොමැත.

මෙම විනය පරීක්ෂණ සම්පූර්ණ වාර්තාව A-9 ලෙස ඉල්ලුම්කාර පාර්ශ්වය විසින්ම බේරුම්කාර අධිකරණයට ඉදිරිපත් කර ඇත. ඉහත සඳහන් කළ A-8, A-9 දරන වාර්තා පරිශිලනය කිරීමේදී හා ඉදිරිපත් වූ සාක්ෂි සලකා බැලීමේදී මූලික විමර්ශනය සහ විනය පරීක්ෂණයේදී ඉල්ලුම්කරුට කිසිදු අසාධාරණයක් නොවන පරිදි සිදුකොට ඇති බවට මා තීරණය කරමි.

සියළුම සාක්ෂි විග්‍රහ කර බැලීමේදී මාගේ නිගමනය වනුයේ ඉල්ලුම්කරු 2016.10.17 වන දින රැකියාව සඳහා පැමිණ ඇති නමුත් ඔහු හදිසි වැටලීම සිදුකරනු ලැබූ අවස්ථාවේ සේවා ස්ථානයේ නොසිටි බව. ඉන් දින දෙකකට පසු සේවා ස්ථානයට පැමිණ වාර්තා කර ඇති බවත්ය.

මෙම ඉල්ලුම්කරුගේ පළමු ප්‍රකාශය සමග A-2 ලෙසට ඉදිරිපත් කර ඇති ලේඛණයේ ඉල්ලුම්කරු විසින් 2016.10.17 වන දින සිදුකරා යැයි කියනු ලබන වරදට අමතරව මීට පෙර මේ සමානම වරදවල් වන අනවසරයෙන් සේවා ස්ථානය හැරයාම සම්බන්ධයෙන් පෙර වැරදි 06 ක් සිදුකොට ඇති බවත්, එකී වරදවල් 6 ටම ඉල්ලුම්කරු විසින් වරද පිළිගෙන ඇති බවත්, පෙනී යයි. (මෙම පෙර වැරදි සියල්ලම ඉල්ලුම්කරු විසින්ම බේරුම්කරණයට ඉදිරිපත් කර ඇත.)

එසේම 2016.10.17 වන දින සිට සිදුකරා යැයි කියනු ලබන වරද සම්බන්ධයෙන්ද දෙනු ලැබූ විනය නියෝගයට එරෙහිව 2017.05.12 වන දින ඉදිරිපත් කරන ලද අභියාචනයේදී ද ඔහු මේ හා සමාන වැරදි කර ඇති බවත් ඉන් බොහොමයක් කාලාවරෝධ වීම මගින් අහෝසි වී ඇති බවත්, පෙන්වා දෙමින් මෙම බේරුම්කරණයට අදාළ වරද ඔහු විසින් පිළිගනිමින් දඬුවම අඩු කර ගැනීමට උත්සාහ දරා ඇති බව පෙන්නුම් කරයි. මෙහිදී ඔහු විසින් මෙම බේරුම්කරණයට අදාළ වරද සිදු කළ බවත් එය සේවයෙන් පහ කිරීමට තරම් බරපතල වරදක් නොවන බවටත් ප්‍රකාශ කර ඇත. මෙම සිද්ධියට ප්‍රථමයෙන් සිදුකර ඇති මේ හා සමානම විශමාචාරයේදී මින්මතු මෙවැනි වරදක් සිදු කලහොත් සේවයෙන් පහ කරන බවට තරයේ අවවාද කර ඇත.

ඉහත කරුණු සියල්ලම හා දෙපාර්ශ්වය දෙන ලද සාක්ෂි හා ඉදිරිපත් කරන ලද ලේඛන සියල්ලම සලකා බැලීමේදී මෙම ඉල්ලුම්කරු දෙවන පාර්ශ්වයේ පරීක්ෂණ කණ්ඩායම විසින් එකී සේවා ස්ථානය පරීක්ෂා කරන අවස්ථාවේ ඉල්ලුම්කරු එහි නොසිටි බව එනම් සේවා ස්ථානය හැරයාම යන වරද සිදුකර ඇති බවට විනය පරීක්ෂණයේදී තීරණය කර, දෙන ලද නියෝගය ප්‍රතික්ෂේප කිරීමට තරම් කිසිදු අයුරකින් පිළිගත හැකි බව සාක්ෂියක් ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර නොමැති බවත් ඉල්ලුම්කරුව සේවයෙන් පහ කිරීම නිසි ක්‍රමවේදය අනුගමනය කරමින් සිදුකරන ලද බවට නිගමනය කරමින් ඉල්ලුම්කරුගේ සියලු ඉල්ලීම් නිෂ්ප්‍රභා කරමි.

මෙම නියෝගය සාධාරණ හා යුක්ති සහගත බවත් ප්‍රකාශ කර සිටිමි.

නීතිඥ ටී. සී. ජේ. පීරිස්,
බේරුම්කරු.

EOG 09-0202

මගේ අංකය: IR/COM/01/2021/37.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.11.25 දිනැති හා අංක 2359/60 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.11.22 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මීරිගම, ඉදිපරපේ, අංක 84 හි පදිංචි ආර්.එම්.පී.ආර්.පී. රාජපක්ෂ මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 15, රොක් හවුස් පටුමග, අංක 15 හි පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/76/2023 හා 2025.08.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

ගොනු අංකය :IR/COM/01/2021/37
නඩු අංකය : A/76/2023

ආර්.එම්.පී.ආර්.පී. රාජපක්ෂ මිය,
අංක 84,
ඉදිපරපේ,
මීරිගම.

*පළමු පාර්ශ්වය*

සහ

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක 15,
රොක් හවුස් පටුමහ,
කොළඹ 15.

*දෙවන පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල

ඉහත පාර්ශ්වයන් අතර පවතින ආරාවුල සම්බන්ධයෙන් ගරු කම්කරු හා විදේශ රැකියා ආමාත්‍ය මනූෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වු ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙකී ආරාවුල නිරාකරණය කිරීම සඳහා මා පත් කොට ඇත.

ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුලට හේතු වූ කරුණ වන්නේ “ 2012.04.01 දිනට මාස 03 කට පෙර සභාපති රහස්‍ය ලේකම් තනතුරට පත් කළ අයට ලබා දී ඇති වරප්‍රසාද 2012.04.01 දින සමාන්‍යාධිකාරී රහස්‍ය ලේකම් තනතුරට පත් කළ ආර්. එම්. පී. ආර්. පී. රාජපක්ෂ මියට හිමි ද හිමි නම් එය ලබා නොදීම මගින් පැමිණිලිකාරියට අසාධාරණයක් සිදුව තිබේ ද, යන්නත් ආර්. එම්. පී. ආර්. පී. රාජපක්ෂ මියට නව බඳවා ගැනීමේ සේවක ඇස්තමේන්තුව අනුමත වීමට ප්‍රථම MM -1 - 1 ශ්‍රේණියේ ලබා දී ඇති මෙම තනතුර නව බඳවා ගැනීමේ පටිපාටිය අනුව JM - 1- 1 තනතුර ලෙස වෙනස් කිරීම තුළින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් හිමි විය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ ”

“ මෙම නඩුවේ පළමු පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කරු වන ආර්. එම්. පී. ආර්. පී. රාජපක්ෂ සමග නියෝජිත වශයෙන් සරත් රොබට්සන් මහතා පෙනී සිටී. දෙවන පාර්ශ්වය වෙනුවෙන් රජයේ නීතිඥ ඇම්බෲසි නිමේෂා රුක්ෂානි මෙනවිය පෙනී සිටී. දෙවන පාර්ශ්ව ආයතනය වෙනුවෙන් නීති නිලධාරි දිනිති විජේසේකර මෙනවිය සමග ප්‍රධාන ලිපිකාරිනි ජී. එච්. දමයන්ති යන අය පෙනී සිටී ආයතනයේ සාක්ෂිකරුවන් ලෙස මානව සම්පත් කළමනාකරු සිසිල් විජේතුංග මහතා පෙනී සිටී. දෙවන පාර්ශ්වයේ රජයේ නීතිඥ වෙනුවෙන් 2024.11.25 දින රජයේ නීතිඥ දිල්හානි රත්නායක මිය පෙනී සිට ඇත. 2025.04.08 වන දින දෙවන පාර්ශ්වය විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරි වන සමරසේකර මුදියන්සේලාගේ මොහාන් දීපලාල් සමරවීර මහතා පෙනී සිටී. තව ද 2024.02.20 දින පරිපාලන නිලධාරි මනෝජා ආරියරත්න සහ කළමනාකාර සහකාර පී. පී. ඒ. පී. සුභාෂිණි මිය පෙනී සිටී.”

අංක ඒ /76/2023 දරන නඩුවේ පහත සඳහන් දිනයන්හි ද කාර්මික අධිකරණයට දෙපාර්ශ්වය කැඳවා නඩු විභාගය පවත්වා ඇත. 2023.12.14, 2024.01.11, 2024.01.26, 2024.02.20, 2024.02.29, 2024.03.19, 2024.05.02, 2025.06.18, 2024.07.15, 2024.07.22, 2024.08.05, 2024.09.09, 2024.10.01, 2024.11.25, 2025.01.06, 2025.02.10, 2025.02.20 සහ 2025.04.08 දින පවත්වා ඇත. මීට අමතරව පළමු පාර්ශ්වය විසින් ලිඛිත දේශන 2023.12.13, 2025.05.07 ඉදිරිපත් කර ඇත. දෙවන පාර්ශ්වයේ ලිඛිත දේශන 2024.01.26, 2025.04.08, 2025.05.16 දිනයන් වලදී ඉදිරිපත් කර ඇත.

මෙම නඩුව පළමු වරට 2023.12.14 දින කැඳවා ඇත. නමුත් දෙවන පාර්ශ්වයේ ඉල්ලීම මත නඩුව 2024.01.11 වන දිනට කැඳවන ලදි. 2025 01.06 නඩු දිනයේ දී නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරියගේ ප්‍රකාශය අනුව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ නීති නිලධාරිනිය වන දිනිති විජේසේකර මහත්මිය විසින් වාචිකව දැනුම් දෙන ලද්දේ, දෙවන පාර්ශ්ව ආයතනයේ සභාපති විසින් මෙම නඩුව සමථ කිරීමට කටයුතු කරන ලෙසටත් ඒ පිළිබඳව බේරුම්කරණය දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසටත් දැනුම් දී ඇති බවත්ය. පළමු පාර්ශ්වයේ නියෝජිත මහතාගේ ප්‍රකාශ පරිදි ආයතනය විසින් ඉදිරිපත් කරනු ලබන සමථ යෝජනා ඉල්ලුම්කාරිය සමග සාකච්ඡා කර ඉදිරිපත් කරන්නේ නම් අධිකරණයේ දී විසඳා ගත යුතු කරුණු සම්බන්ධයෙන් පහසුවක් වනු ඇත. එබැවින් ඉල්ලුම්කාරිය වෙනුවෙන් කියා සිටින්නේ එම සමථ යෝජනා ඉල්ලුම්කාරියගේ එකඟත්වය ඇතිව ගරු අධිකරණයට ඉදිරිපත් කරන ලෙසයි.

නමුත් 2025.02.10 වන දින දෙවන පාර්ශ්වය වෙනුවෙන් ප්‍රකාශ කර සිටින්නේ දෙවන පාර්ශ්වකාර ආයතනයේ සභාපති විසින් 2025.02.06 දිනැතිව ලිපියක් යොමු කරමින් ප්‍රකාශ කර ඇත්තේ දෙවන පාර්ශ්වකාර ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙම නඩුව මෙම අවස්ථාවේ දී සමථයක් ඇති කර නොගැනීමට සහ නඩුව ඉදිරියට පවත්වා ගෙන යාමට යි. ඒ අනුව සමථයක් නොමැති බව ප්‍රකාශ කර සිටී. ඒ අනුව නඩුව ඉදිරියට පවත්වා ගෙන යාමට තීරණය කරන ලදි.

පළමු පාර්ශ්වය විසින් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ 2024.03.11 වන දින ඉල්ලන ලද ඉල්ලුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ ඇති ලේඛන 52 ක් සම්බන්ධයෙන් තොරතුරු දැන ගැනීමේ කොමිෂන් සභාව වෙත අභියාචනයක් සිදු කරමින් 2024.12.03 වන දින ඒ සම්බන්ධයෙන් පැවති විමර්ෂණයකින් පසුව 2025.02.19 වන දින එම ලේඛන 52 න් ලේඛන 41 ක් ලබා දුන් අතර එම ලේඛන වලින් බහුතරය සත්‍ය පිටපතක් ලෙසත් සහතික කර ඇත. එයට හේතුව වශයෙන් අදාළ බලධාරින් දන්වා ඇත්තේ එම ලේඛනවල මුල් පිටපත් ඉල්ලුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවේ නොමැති බවයි.

දෙපාර්ශ්වය විසින් නඩුව 2025.04.08 දින අවසන් කර 2025.05.09 වන දින හෝ ඊට පෙර දෙපාර්ශ්වයටම ලිඛිත දේශන ගොනු කිරීම සඳහා අවස්ථාව ලබා දී ඇත.

**නිරීක්ෂණ හා නිගමන :**

ඉල්ලුම්කාරි 1996.06.19 වන දින සිට කොන්ත්‍රාත් පදනම මත ලඝු ලේඛිකා තනතුරට පත් කර ඇත. 2001.11.01 දින සිට ලඝු ලේඛිකා තනතුරේ 2 වන ශ්‍රේණියට ස්ථිර පත් වීම් ලබා දී ඇත. ඉල්ලුම්කාරිය 2012.04.01 වන දින සිට සාමනාන්‍යාධිකාරි රහසා ලේකම් තනතුරට බඳවා ගෙන ඇත. ඉල්ලුම්කාරිය දැනට සිටින සේවා මට්ටම MM - 1 - 1 මධ්‍යම කළමනාකරණ මට්ටම වේ. නමුත් 2013.01.14 ට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් සාමානාන්‍යාධිකාරි රහසා ලේකම් තනතුර වෙනුවට JM - 1 -1 කණිෂ්ඨ කළමනාකාර තනතුරක් පිහිටුවා ඇත. නමුත් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරන ලද අනුමත කාර්ය මණ්ඩල ලේඛනය පරිදි 2013 ට ප්‍රථම ආයතනයේ තිබූ තනතුරු දරන්නාට පෞද්ගලික වන සේ සේවා ගණය සහ වැටුප් තලය ලබා දී ඇත.

පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන කරුණු අනුව 2012.04.01 දින සිට ඉල්ලුම්කරු සාමානාන්‍යාධිකාරි රහසා ලේකම් තනතුරට පත් කිරීම සම්බන්ධයෙන් කියා සිටින එම තනතුර ඉල්ලුම්පත් කැඳවා නියමිත පරිදි සම්මුඛ පරීක්ෂණ පවත්වා පත්වීම් ලබා දී ඇත. දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව සාමානාන්‍යාධිකාරි රහසා ලේකම් තනතුරත් 2001 අවුරුද්දේ අනුමත කරපු කාඩර් එකක් නොමැති බවත් ඉල්ලුම්කරුගේ ඉල්ලීම පරිදි පත් කරපු බවයි. එසේම සභාපති රහසා ලේකම් තනතුරට පත් කරන ලද නිලධාරින් නීත්‍යානුකූල නොවන ආකාරයෙන් පත් කර ඇත. සාමානාන්‍යාධිකාරි රහසා ලේකම් තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2013.01.17 දිනැතිව අනුමත කරන ලද සේවක සංඛ්‍යාව සඳහා අදාළ වන්නේ ද නැත. අනුමත කර ඇත්තේ සභාපති පෞද්ගලික ලේකම් සහ සාමානාන්‍යාධිකාරි පෞද්ගලික ලේකම් යන තනතුරු දෙකක් JM 1 - 1 කේතය යටතේ විශේෂයෙන්ම 2004.07.15 දින පවත්වන ලද සාක්ෂි විභාගයේ දී ඉල්ලුම්කාරිය MM 1 - 1 කේතය ලබන බවත් JM 1-1 මට්ටමට පහත හෙළීමක් සිදු කර නොමැති බවත් සඳහන් කර ඇත. ඒ අනුව 2013.04.22, 2014.05.13, 2015.04.01 සහ 2016.06.24 දිනවල සහ කළමනාකාරණ සේවා චක්‍රලේඛ 2/2016 අනුව 2016.01.01 දින පරිවර්ථනය අනුව ඉල්ලුම්කරුගේ සේවා ගණනය " ජොෂ්ඨ වැටුප් කේතය (MM - 1 - 1) සමග සාමානාන්‍යාධිකාරි රහසා ලේකම් යන තනතුරක් ලබා දී ඇත. එසේම දෙවන පාර්ශ්ව ආයතනය විසින් ඉල්ලුම්කාරියට 2017.01.13 වැටුප් පරිවර්ථනය කිරීම 2017.11.06, 2018.11.03, 2019.05.06, 2019.12.05 සහ 2020.08.13 සමානාන්‍යාධිකාරි රහසා ලේකම් I වන ශ්‍රේණිය ලෙස සඳහන් කර ඇත. තව ද 2021.04.05. 2022.04.07, 2023.06.06 දින වලදි ඉල්ලුම්කාරියට ලබා දුන් වැටුප් වර්ධකවලත් එම තොරතුරු පැහැදිලිව සඳහන් කර ඇත. ඒ අනුව ඉල්ලුම්කාරියට සාමානාන්‍යාධිකාරි රහසා ලේකම් තනතුර සහ MM - 1 - 1 වැටුප් කේතය නොකඩවා පවත්වා ගෙන යන බව පෙනී යයි.

ඉල්ලුම්කාරියගේ ඉල්ලීමක් වන සහනදායි පදනම මත මෝටර් රථ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018.02.15 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2018 අනුව දෙවන පාර්ශ්වය ආයතනය විසින් ඇයව නිර්දේශ කර නොමැත. එම චක්‍රලේඛනයේ 2.7 අංකය යටතේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත තනතුරු සංඛ්‍යාවෙන් බැහැරව ආයතනය විසින් ඇති කරනු ලබන තනතුරක සේවය කරන නිලධාරින් සහ එම චක්‍රලේඛනයේ 02 වන අංකය යටතේ සේවය කරනු ලබන සේවකයින් හිමිකම් නොලබන බව සඳහන් කර ඇත. එම නිසා දෙවන පාර්ශ්ව ආයතන විසින් සහනදායි පදනම මත වාහන බලපත්‍ර නිර්දේශ නොකිරීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පාර්ශ්වයේ ස්ථාවරය පිළිගත හැකිය.

**ප්‍රදානය :**

ඉල්ලුම්කාරියට සමානාන්‍යාධිකාරි රහසා ලේකම් තනතුරට අදාළ වැටුප් තලය සහ වැටුප් කේතය ලබා දී ඇති බව දෙපාර්ශ්වය විසින්ම ඉදිරිපත් කරන ලද සාක්ෂි සහ ලේඛනවලින් පැහැදිලි වේ. ඒ නිසා ඉල්ලුම්කාරිය ඉල්ලා සිටින සභාපති රහසා ලේකම් තනතුර සඳහා සමකාලීනව බඳවා ගත් නිලධාරිනියට අතිරේක වැටුප් වර්ධක ලබා දීම තුළින් තමන්ට අසාධාරණයක් සිදු වී ඇති යන පදනම පිළිගත නොහැකි බැවින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

ආර්. එම්. පී. ආර්. පී. රාජපක්ෂ මිය හට නව බඳවා ගැනීමේ සේවක ඇස්තමේන්තුව අනුමත වීමට ප්‍රථම MM - 1- 1 ශ්‍රේණිය ලබා දී ඇති මෙම තනතුර නව බඳවා ගැනීමේ පටිපාටිය මගින් JM 1 - 1 තනතුර ලෙස වෙනස් කිරීම සිදු වී නොමැති බැවින් ඒ තුලින් ද අසාධාරණයක් සිදු වී නොමැති බව තීරණය කර මෙම ඉල්ලීම නිෂ්ප්‍රභ කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

**ඒ.එල්.එම් සලීම්,**
බේරුම්කරු.

2025 අගෝස්තු මස 20 වන දින දීය.

EOG 09-0203

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.